# වාර්ෂික වාර්තාව

# 2018

# විගණන සේවා කොමිෂන් සභාව


**අංක 35 ඒ,**

**ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත,**

**කොළඹ 08.**

**දුරකථන : 0112-674659 /0112674660**
**ෆැක්ස් : 0112-674657**
**ඊ මේල් : secretaryasc@sltnet.lk**
**ascoffice@sltnet.lk**

## දැක්ම

මහජන බැඳියාව සහ වගවීම සඳහා කැප වූ

විශිෂ්ට විගණන සේවයක්

## මෙහෙවර

වෘත්තීයමය භාවය, නිපුණත්වය සහ යහපාලනය

පෙරදැරි කර ගත් රාජ්‍ය විගණන සේවයක් ස්ථාපනය

කිරීම තුළින් රාජ්‍ය සම්පත් වලට වගවීම සහතික

කිරීම

## අපගේ අගයන්

- ස්වාධීනත්වය
- අපක්ෂපාතීත්වය
- අවංක භාවය
- නවෝත්පාදනය
- පාරදෘශ්‍යභාවය
- වගවීම
- වෘත්තීය නිපුණත්වය

# විගණන සේවා කොමිෂන් සභාව

## සභාපති

එච්.එම්. ගාමිණී විජේසිංහ මහතා

## සාමාජිකයින්

විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මහතා

අයි. ගාමිණී අබේරත්න මහතා

වී. කන්දසාමි මහතා

ඩබ්ලිව්.ඒ. සෝමපාල පෙරේරා මහතා

# පෙළගැස්ම



| අනු අංකය | කාරණය | පිටුව |
|---|---|---|
| 1. | හැඳින්වීම | 1 |
| 2. | විගණන සේවා කොමිෂන් සභාවේ බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් | 1-2 |
| 2.1 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල හා කාර්යයන් | 1 |
| 2.2 | 2018.08.01 දින සිට ක්‍රියාත්මක වන 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව පැවරී ඇති බලතල හා කාර්යයන් | 2 |
| 3. | විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධනය-2018 | 2-8 |
| 3.1 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ජාතික විගණන පනත අනුව පැවරී ඇති කාර්යයන්හි ප්‍රගතිය | 2-3 |
| 3.2 | කොමිෂන් සභාව විසින් ඉටු කරන ලද අනිකුත් කර්තව්‍යයන් | 4 |
| 3.3 | පරිපාලන, මූල්‍ය සහ අනෙකුත් කටයුතු | 4-8 |
| 4. | කාර්ය මණ්ඩලය | 9-11 |
| 4.1 | කාර්ය මණ්ඩල සංයුතිය | 9 |
| 4.2 | සංවිධාන සටහන | 10 |
| 5. | කොමිෂන් සභා රැස්වීම් | 11 |
| 6. | ස්තුතිය | 11 |

# විගණන සේවා කොමිෂන් සභාව

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII වන පරිච්ඡේදයේ 153 අ (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ අංක 24 (1) වගන්තිය ප්‍රකාරව විගණන සේවා කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව විගණකාධිපතිවරයා විගණන සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා වන අතර එම කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයන් වන්නේ,

අ. නියෝජ්‍ය විගණකාධිපති හෝ ඊට ඉහළ ධුරයක් උසුලන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ලත් නිලධරයන් දෙදෙනෙකු

ආ. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ,අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ විශ්‍රාම ලත් විනිශ්චයකාරවරයකු

ඇ. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාම ලත් I වන පන්තියේ නිලධරයකු

## 2. විගණන සේවා කොමිෂන් සභාවේ බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන්

### 2.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඇ විධිවිධාන අනුව කොමිෂන් සභාවට අදාළ බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන්

I. ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින්ගේ පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමේ බලය.

II. අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිපත්තිවලට යටත්ව ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින්ගේ සේවයට බඳවා ගැනීමේ පටිපාටි, පත් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම්වලට අදාළ රීති සකස් කිරීම.

III. නීතිය මඟින් ස්ථාපිත ජාතික විගණන සේවයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම.

IV. නීතිය මඟින් සලකනු ලබන පරිදි වූ වෙනත් බලතල, කාර්ය සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීමේ බලය.

## 2.2 2018.08.01 දින සිට ක්‍රියාත්මක 2018 අංක 19 දරන ජාතික විගණන පනත මඟින් පැවරී ඇති බලතල හා කාර්යයන්

I. කොමිෂන් සභාවේ කටයුතුවලට සහය වීම සඳහා කමිටු පත් කිරීම

II. ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ක්‍රම හඳුන්වා දීම

III. පනතේ විධිවිධාන සලසා ඇති කරුණු සඳහා රීති සැකසීම.

# 3. විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධනය - 2018

## 3.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව පැවරී ඇති කාර්යයන්හි ප්‍රගතිය

| අනු අංකය | කාර්යයන් | ප්‍රගතිය |
|---|---|---|
| 1 | ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින්ගේ පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම | I. ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා කෙටුම්පතට අදාළව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ, ජාතික වැටුප් කොමිෂන් සභාවේ සහ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ ලබාගෙන එම නිර්දේශ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස විගණකාධිපතිට උපදෙස් ලබා දීම<br><br>II. පත් කිරීම් හා ඊට අනුශාංගික කරුණු<br>➢ පත්වීම් ස්ථිර කිරීම් - 05<br>➢ විශ්‍රාම ගැන්වීම් - 08<br>➢ ඉල්ලා අස්වීම් - 01<br><br>III. උසස් කිරීම<br>සහකාර විගණකාධිපති තනතුර සඳහා නිලධාරීන් 11ක් උසස් කිරීම |

| | | |
|---|---|---|
| 2 | ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින්ගේ සේවයට බඳවා ගැනීමේ පටිපාටි, පත් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම්වලට අදාළ රීති සකස් කිරීම | විගණන සේවා කොමිෂන් සභා - කාර්ය පටිපාටික රීති සංග්‍රහ කෙටුම්පත සඳහා සමාලෝචන හා නිරීක්ෂණ ලබා ගැනීම |
| 3 | ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම | ජාතික විගණන කාර්යාලයේ 2019 වාර්ෂික අයවැය ඇස්තමේන්තු කෙටුම්පත සමාලෝචනය කර ගරු කථානායකතුමා වෙත යොමු කිරීම |
| 4 | කාර්ය සාධන විගණන, පාරිසරික විගණන, තාක්ෂණික විගණන සහ වෙනත් යම් විශේෂ විගණන සඳහා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල කිසිදු විගණන ප්‍රමිතියක් නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවකදී, ඊට අදාළ ප්‍රමිති සකස් කිරීම | අදාළ විගණන ප්‍රමිතීන් සම්බන්ධයෙන් අධ්‍යයනය කොට ඒ සම්බන්ධ නිර්දේශ විගණන සේවා කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කර එම කමිටුවේ නිරීක්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස විගණකාධිපති වෙත දැනුම් දීම |
| 5 | කොමිෂන් සභාවේ කටයුතුවලට සහය වීම සඳහා කමිටු පත් කිරීම | ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කිරීම සඳහා වන සේවා ව්‍යවස්ථා සංග්‍රහය කෙටුම්පත් කිරීමට සාමාජිකයන් පස් දෙනෙකුගෙන් යුත් විද්වත් කමිටුවක් පත් කිරීම. |

### 3.2 කොමිෂන් සභාව විසින් ඉටු කරන ලද අනිකුත් කර්තව්‍යයන්

- කොමිෂන් සභාව සඳහා වෙබ් අඩවියක් ආරම්භ කර එය 2018.01.26 දින සිට එළි දැක්වීම
- ඉන්දියානු කොම්ප්ට්‍රෝලර් සහ විගණකාධිපති කාර්යාලය සමඟ දැනුම හා අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා වූ අධ්‍යයන චාරිකාවක් සඳහා 2018.05.02 දින සිට 2018.05.10 දින දක්වා විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් සහභාගී වීම
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් පැවැත්වීම

### 3.3 පරිපාලන, මූල්‍ය සහ අනෙකුත් කටයුතු

(අ) විගණන සේවා කොමිෂන් සභාවේ සමස්ත පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය හා තොරතුරු කළමනාකරණ සම්බන්ධ කාර්යභාරය පාලන අංශය විසින් මෙහෙයවනු ලබන අතර, මූල්‍ය කටයුතු හා ස්ථාවර වත්කම් වාර්තා කිරීමට අදාළ සියලු කටයුතු ගිණුම් අංශය විසින් ඉටු කරනු ලබයි.


(ආ) ජාතික විගණන කාර්යාලයේ සේවය කරන විගණන සේවයේ ,විගණන පරීක්ෂක සේවයේ සහ විගණන නොවන කාර්ය මණ්ඩලයේ පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම් සහ විනය පාලනය සම්බන්ධ කටයුතු විගණන සේවා කොමිෂන් සභාවේ පත් කිරීම්, උසස් කිරීම් හා විනය අංශය මඟින් ඉටු කරනු ලබයි.


(ඇ) 2018 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වශයෙන් රුපියල් මිලියන 44.4 ක් සහ ප්‍රාග්ධන වියදම් වශයෙන් රුපියල් මිලියන 2.8 ක් ලෙස වියදම් දැරීම සඳහා රුපියල් මිලියන 47.2 ක් වාර්ෂික ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් සලසා තිබුණි.


(ඈ) 2018 වර්ෂයේ විගණන සේවා කොමිෂන් සභාවේ ප්‍රතිපාදන, වියදම් සහ ඉතිරිය පිළිබඳව සාරාංශය පහත පරිදි වේ.

| | ප්‍රතිපාදන රු. (2018 වාර්ෂික ඇස්තමේන්තුව අනුව) | අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීම - 2018 රු. | මු.රෙ.66 මාරු කිරීම්- 2018 රු. | අනුමත මුළු ප්‍රතිපාදන වෙන් කිරීම 2018 රු. | මුළු වියදම (2018.01.01- 2018.12.31) රු. | ඉතිරිය (2018.12.31 දින වන විට) රු. |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන | 44,322,000.00 | 1,000,000.00 | (925,000.00) | 44,397,000.00 | 37,432,201.85 | 6,964,798.15 |
| ප්‍රාග්ධන | 1,885,000.00 | - | 925,000.00 | 2,810,000.00 | 2,507,372.31 | 302,627.69 |
| එකතුව | **46,207,000.00** | **1,000,000.00** | **-** | **47,207,000.00** | **39,939,574.16** | **7,267,425.84** |

## විගණන සේවා කොමිෂන් සභාවේ මූල්‍ය සාරාංශය (2018)



## 2018 වර්ෂයේ සම්පූර්ණ මූල්‍ය වාර්තාව

### විගණන සේවා කොමිෂන් සභාව

| වැය විෂය | විස්තරය | වාර්ෂික ප්‍රතිපාදන වෙන් කිරීම - 2018 රු. | අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීම - 2018 රු. | මු.රෙ. 66 මාරු කිරීම් 2018 රු. | වියදම2018-01-01 සිට 2018-12-31 දක්වා රු. |
|---|---|---|---|---|---|
| 23-01-01 | **පුනරාවර්තන වියදම්** | 44,322,000.00 | - | - | 37,432,201.85 |
| | **පුද්ගල පඩි නඩි** | 22,000,000.00 | | | 16,328,486.44 |
| 1001 | වැටුප් හා වේතන | 15,000,000.00 | | (3,936,431.70) | 7,605,773.75 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,000,000.00 | | | 103,581.41 |
| 1003 | වෙනත් දීමනා | 6,000,000.00 | | 2,632,000.00 | 8,619,131.28 |
| | **ගමන් වියදම්** | 1,100,000.00 | | | 2,194,100.50 |
| 1101 | දේශීය | 100,000.00 | | | 7,000.00 |
| 1102 | විදේශීය | 1,000,000.00 | 1,000,000.00 | 200,000.00 | 2,187,100.50 |
| | **සැපයුම්** | 1,972,000.00 | | | 1,709,354.88 |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය වියදම් | 1,000,000.00 | | 101,889.30 | 1,101,889.30 |
| 1202 | ඉන්ධන සැපයීම් | 700,000.00 | | | 432,938.46 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 272,000.00 | | | 174,527.12 |
| | **නඩත්තු වියදම්** | 900,000.00 | | | 340,895.33 |
| 1301 | වාහන නඩත්තු වියදම් | 700,000.00 | | (200,000.00) | 303,680.18 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් | 200,000.00 | | | 37,215.15 |
| | **සේවා** | 16,950,000.00 | | | 16,567,168.13 |
| 1401 | ප්‍රවාහන වියදම් | 1,200,000.00 | | 328,750.00 | 1,527,943.55 |
| 1402 | තැපැල් හා සංනිවේදන වියදම් | 1,500,000.00 | | | 776,766.69 |
| 1403 | විදුලිය හා ජල වියදම් | 720,000.00 | | | 301,242.55 |
| 1404 | බදු කුලී හා දේශීය බදු | 10,530,000.00 | | 975,681.70 | 11,505,681.70 |
| 1409 | වෙනත් වියදම් | 3,000,000.00 | | (101,889.30) | 2,455,533.64 |
| | **මාරු කිරීම්** | 1,400,000.00 | | | 292,196.57 |
| 1505 | සම්මාදම් සහ දායක මුදල් | 100,000.00 | | | - |
| 1506 | රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | 1,300,000.00 | | (925,000.00) | 292,196.57 |
| 23-01-01 | **ප්‍රාග්ධන වියදම්** | 1,885,000.00 | - | - | 2,507,372.31 |
| | **මූලධන වත්කම පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම** | 400,000.00 | | | 185,201.81 |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 200,000.00 | | | 150,201.81 |
| 2003 | වාහන | 200,000.00 | | | 35,000.00 |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | 1,000,000.00 | | | 1,924,420.50 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 1,000,000.00 | | 925,000.00 | 1,924,420.50 |
| | **මානව සම්පත් සංවර්ධනය** | 485,000.00 | | | 397,750.00 |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 485,000.00 | | | 397,750.00 |
| | **මුළු එකතුව** | 46,207,000.00 | - | - | 39,939,574.16 |

(ඉ) විගණන සේවා කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන් යටතේ 2018 වර්ෂය තුල නිලධාරීන් විවිධ ක්ෂේත්‍ර යටතේ පහත දැක්වෙන පරිදි පුහුණු සඳහා යොමු කර ඇත.

| | පුහුණු වැඩසටහනේ නම | තනතුර | නිලධාරීන් ගණන |
|---|---|---|---|
| 1 | කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | පරිපාලන නිලධාරි | 01 |
| 2 | වෘත්තීය අරමුණු සඳහා ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව | රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| 3 | ප්‍රවාහන කළමනාකරණය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| 4 | කළමනාකරණ සහකාරවරුන් සඳහා වන පරිගණක පාඨමාලාව | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| 5 | රාජකාරි ලිපි ලිවීමේ හැකියාව පිළිබඳ පාඨමාලාව | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| 6 | රියදුරන්ගේ රාජකාරි හා වගකීම් පිළිබඳ පාඨමාලාව | රියදුරු | 01 |
| 7 | කනිෂ්ඨ විධායකයින් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව ( රාජ්‍ය කළමනාකරණ සහකාර,සංවර්ධන නිලධාරී) | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| 8 | රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව | ගණකාධිකාරී | 01 |
| 9 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන්ගේ ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන | ගණකාධිකාරී | 01 |
| 10 | නව සිගාස් පුහුණු වැඩමුළුව | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| 11 | අයවැය ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන | ගණකාධිකාරී<br>රාජ්‍ය කළමනාකරණ සහකාර | 01<br>02 |
| 12 | තිරසාර ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන | ගණකාධිකාරී | 01 |

| | | | |
|---|---|---|---|
| 13 | ගූගල් සමඟ ඩිජිටල්කරණය හරහා කාර්යයන් පහසු කර ගන්නා ආකාරය පිළිබඳ වැඩමුළුව | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | 01 |
| 14 | ලංසු ලියවිලි සැකසීම හා ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| 15 | පෞද්ගලික ලිපිගොණු කළමනාකරණය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| 16 | රාජ්‍ය විගණන ප්‍රමිති හා විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | පරිපාලන නිලධාරි | 01 |
| 17 | කාර්ය මණ්ඩල අභිප්‍රේරණ වැඩසටහන | සියලුම කාර්ය මණ්ඩලය | 24 |
| 18 | ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්/ අභ්‍යන්තර විගණකවරුන් සඳහා පුහුණු වැඩමුළු | ගණකාධිකාරි | 01 |


# 4. කාර්ය මණ්ඩලය

## 4.1 කාර්ය මණ්ඩල සංයුතිය

විගණන සේවා කොමිෂන් සභාව සඳහා අනුමත කර ඇති මුළු තනතුරු සංඛ්‍යාව 43කි. 2018.12.31 දිනට විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සංයුතිය පහත පරිදි වේ.

| තනතුරේ මට්ටම | තනතුර | සේවය | ශ්‍රේණිය/ පන්තිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | ලේකම් | | | 01 | 01 | 0 |
| | අතිරේක ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය | විශේෂ | 01 | 0 | 01 |
| | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය | I | 01 | 01 | 0 |
| | අධ්‍යක්ෂ | දීප ව්‍යාප්ත සේවා | I | 01 | 0 | 01 |
| | සහකාර ලේකම් | ශ්‍රී ලංකා පරිපාලන සේවය | III /II | 02 | 0 | 02 |
| | සහකාර අධ්‍යක්ෂ | දීප ව්‍යාප්ත සේවා | III /II | 01 | 0 | 01 |
| | විගණන අධිකාරි | ශ්‍රී ලංකා විගණන සේවය | III /II | 01 | 0 | 01 |
| | ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | III /II | 01 | 01 | 0 |
| | නීති නිලධාරි | දෙපාර්තමේන්තු ගත | III /II | 01 | 0 | 01 |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරි | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | අධි පන්තිය | 01 | 01 | 0 |
| | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | II/ I | 03 | 0 | 03 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 2 පන්තිය II/ I | 01 | 01 | 0 |
| ද්විතීය මට්ටම | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 3 පන්තිය III /II/ I | 01 | 0 | 01 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | III /II/ I | 15 | 11 | 04 |
| ප්‍රාථමික මට්ටම | රියදුරු | රියදුරු සේවය | III/II/ I | 06 | 04 | 02 |
| | කාර්යාල කාර්ය සහයක | කාර්යාල සේවක සේවය | III/II/ I | 06 | 05 | 01 |
| එකතුව | | | | 43 | 25 | 18 |

## 4.2 සංවිධාන සටහන


විගණන සේවා කොමිෂන් සභාවේ සංවිධාන සටහන
කොමිෂන් සභාව
ලේකම්
අතිරේක ලේකම්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධ්‍යක්ෂ
සහකාර ලේකම්
සහකාර ලේකම්
ගණකාධිකාරී
නීති නිලධාරී
සහකාර අධ්‍යක්ෂ
විගණන අධිකාරී
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
අනෙකුත් කාර්ය මණ්ඩලය (කාර්යාල කාර්ය සහායක/රියදුරු)


## 5. කොමිෂන් සභා රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුල කොමිෂන් සභා රැස්වීම් 17 ක් සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කිරීම සඳහා වන සේවා ව්‍යවස්ථා සංග්‍රහය කෙටුම්පත් කිරීමට කමිටුවක් පත් කිරීම සඳහා විශේෂ කොමිෂන් සභා රැස්වීම් වාර එකක් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

## 6. ස්තුතිය

විගණන සේවා කොමිෂන් සභාවේ කාර්යයන් ඉටුකිරීම සඳහා සහය ලබා දුන් ජනාධිපති ලේකම් කාර්යාලයේ, පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයේ, රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ , මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ, ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයටද, විගණන සේවා කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයටද කොමිෂන් සභාවේ කෘතවේදීත්වය පල කරනු කැමැත්තෙමු.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 උෟ ව්‍යවස්ථාව අනුව විගණන සේවා කොමිෂන් සභාව සඳහා 2018 වර්ෂය වෙනුවෙන් මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| එච්.එම්. ගාමිණී විජේසිංහ මහතා | සභාපති |  |
| විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මහතා | සාමාජික |  |
| අයි. ගාමිණී අබේරත්න මහතා | සාමාජික |  |
| වී. කන්දසාමි මහතා | සාමාජික |  |
| ඩබ්ලිව්.ඒ. සෝමපාල පෙරේරා මහතා | සාමාජික |  |